# නිර්වාණය ගූඪ අනුභූතියක්ද?

මහාචාර්ය ගුණපාල ධර්මසිරි
දර්ශණ අංශය,
පේරාදෙණිය විශ්ව විද්‍යාලය - පේරාදෙණිය.

සමකාලීන ආගම් පිළිබඳ දර්ශන ක්ෂේත්‍රය තුළ ආගමික අනුභූතිය පිළිබඳ සාකච්ඡාව වැදගත් තැනක් හිමිකර ගනී. එය එසේ වීමට බලපෑ ප්‍රධාන හේතුවක් වූයේ බටහිර දේවධර්මය විසින් එතෙක් අවධාරණයෙන් සලකන ලද "දේව පැවැත්ම තාර්කික සත්‍යයකි." යන මතය, ක්‍රමයෙන් බිඳ වැටීමය. තර්කය හෝ විචාර බුද්ධිය ඇසුරු කොට ගෙන දෙවියන් පිළිබඳ අවබෝධයක් ලද නොහැකි යයි පැහැදිලි වීමෙන් ඒ සඳහා නවමං සෙවීමට බටහිර දේවධර්මවාදීහු උත්සුක වූහ. ආගමික අනුභූතියක් ලෙස දෙවියන් දැකීම පිළිබඳ අදහස ව්‍යාප්ත වූයේ මෙහි ප්‍රතිඵලයක් වශයෙනි. මේ අනුව සමකාලීන බටහිර දේව ධර්මයෙහි මූලික පදනමක් ලෙස "ආගමික අනුභූතිය" යන්න හැඳින්විය හැක. බුදු සමය, සත්‍යය පිළිබඳ ප්‍රධානතම නිර්ණායකය ආනුභූතිය වේ යැයි පිළිගන්නා අතරම, පරම සත්‍යය හෙවත් නිර්වාණයද තමා විසින් ම ප්‍රත්‍යක්ෂයෙන් අවබෝධ කළ යුත්තක් කොට සලකයි. එසේ වුවද පරම සත්‍ය සාක්ශාත්කරණය සඳහා බුදුන් වහන්සේ මෙන්ම සෙසු රහතුන්ද අනුගමනය කොට ඇති ප්‍රතිපදාවන් විමසා බැලීමේ දී අපට පෙනී යන්නේ එයද ආගමික අනුභූතිමය කාර්ය පද්ධතියක ස්වරූපය ගන්නා බවය. එසේ වුව සෘජු ලෞකික අනුභූතියක් විස්තර කරන පදයන්ගෙන් එය විස්තර නොකළ හැකි බව කරුණු පිරික්සීමේ දී අපට පැහැදිලි වේ. නිර්වාණය ගූඪ අනුභූතියක්ද යන ප්‍රශ්නය නැගෙන්නේ මේ හෙයිනි. බෞද්ධ හා තදන්‍ය මූලාශ්‍රයන්ට අනුව මේ කරුණ පිරික්සා බැලීම මෙම ලිපියේ අරමුණයි.

ආගමික අනුභූතිය ගත්විට එහි ස්ථර දෙකක් දැක්විය හැකිය. මෙයින් මූලික ස්ථරය ඉතා සරල වූවකි. මෙය පැහැදිලි කිරීම සඳහා ජෝන් හික් දක්වන උපමාවක් මෙහිදී සිහිපත් වේ. විශාල ගොඩනැගිල්ලක් තුළ අතරමංව හිස හැරුණ අත යමින් සිටින මිනිසෙකු අහම්බෙන් එක්



කාමරයකට ඇතුල් වෙයි. එහි පුද්ගලයන් පිරිසක් රජය පෙරළා දැමීමේ විප්ලවකාරී කුමන්ත්‍රණයක යෙදී සිටින දකින ඔහු තමා ඉතා බිය ගෙන තැනකට පැමිණියාය යන හැඟීමෙන් තැතිගනී. එහෙත් ටික වේලාවකින් කාමරයෙහි උඩින් සවිකරන ලද චිත්‍රපට කැමරාවක් ක්‍රියාත්මක වෙමින් පවතින ආකාරය දක්නා ඔහු තමා ඇත්ත වශයෙන් පැමිණ ඇත්තේ කුමන්ත්‍රණයක් කෙරෙන තැනකට නොව චිත්‍රපටයක් රූපගත කෙරෙන ස්ථානයකට බව තේරුම් ගනී. ඒ සමගම ඔහුගේ බිය පහව යයි.

මෙහිදී සිදුවූයේ එය දෘෂ්ටි කෝණයක් නිසා පහළ වූ අනුභූති පරම්පරාවක් දෘෂ්ටි කෝණය වෙනස් වීම නිසා සම්පූර්ණ වෙනසකට පත්වීමය. ආගමික අනුභූතියෙන් සිදු වනුයේද මෙවැන්නක් බව ජෝන් හික් කියයි.

බැතිමත් දේවවාදියෙකුට ලෝකය පෙනෙන්නේ දෙවියන් විසින් මවන, රකින පූජනීය වූවක් ලෙසය. එනම් සාමාන්‍ය මිනිසාගේ ලෝක දෘෂ්ටියට හාත්පසින් වෙනස් ලෙසකිනි. බැතිමතා යට කී ලෙස දෙවියන් මුල්කරගෙන ලෝකය විග්‍රහ කරන්නේ ඔහු තුළ පවත්නා භක්තිය නිසා මිස ඒ සඳහා වෙනත් හේතු සාධක ඔහුට නැත. පෙර කී දෘෂ්ටාන්තයේ ආ මිනිසාට සිය දෘෂ්ටිකෝණය වෙනස් කරනු සඳහා හේතු සාධක තිබුණි. එහෙත් බැතිමතා දෙවියන් වහන්සේ ලෝකය මැවූ බව අදහන්නේ හේතු සහිතව නොවේ. භක්තිය මත පිහිටා ගනිමිනි. මෙහිදී ඔහු ලබන අනුභූතිය සාමාන්‍ය මිනිසා ලබන අනුභූතියට වඩා වෙනස් වූවකි. එය ආගමික දෘෂ්ටිය නිසා වෙනස් වූ ආගමික අනුභූතියකි. එම අනුභූතිය සුවිශේෂී වූවක් නොව දෘෂ්ටිකෝණමය වෙනසක ප්‍රතිඵලයකි. ඇත්තෙන්ම අනුභූති ජනනය කරනු ලබන්නේ දෘෂ්ටි කෝණය මගිනි.

දේව සංකල්පය ඔප්පු කිරීමේ සාධකයක් ලෙස මෙවැනි අනුභූතියක් ගැනීම සාධාරණ නොවේ. හේතුව, එහි අමුතු සාධකයක් නොමැති වීමය. එකම අමුත්තකට ඇත්තේ එම සංකල්පය පිළිගැනීම පමණි. අනුභූතිය ඇතිවන්නේ දේව සංකල්පය පිළිගැනීමේ ප්‍රතිඵලයක් වශයෙනි. ප්‍රතිග්‍රාහීය ජනිත කළ ප්‍රතිඵලය උපයෝගී කොටගෙන එම ප්‍රතිග්‍රාහිකය ඔප්පු කිරීම කළ නොහැක්කකි.

ආගමික අනුභූතියෙහි දෙවැනි ස්ථරය අයත් වනුයේ ගූඪවාදයටය. ධ්‍යාන යෝග වඩන්නන් කියනුයේ ඔවුන්ට සුවිශේෂී, ගූඪ , ලෝකෝත්තර අනුභූතියක් ප්‍රත්‍යක්ෂ කිරීමට හැකි බවයි. එම ගූඪ අනුභූතිය සුවිශේෂ සාක්ෂියකි. එය ලෝකෝත්තර දිව්‍යමය වූවකි. මේ අනුව ඔවුන් තර්ක කරන්නේ මෙම අනුභූතිය නිසා දෙවියන්ගේ පැවැත්ම ඔප්පු වේ කියාය.

ගූඪ අනුභූතිය ආගමික කරුණු සම්බන්ධයෙන් සාධකයක් සේ ගත හැකිද යන්න මෑත කාලයේදී ඉතා තියුණු ලෙස ඉදිරියට ආ ප්‍රශ්නයකි. එසේ වීමට හේතුවූයේ රසායනික ඖෂධ මගින්ද යට කී යෝගි අනුභූතීන් හා සමාන ගූඪ අනුභූතීන් ජනනය වන බව පැහැදිලි වීමය. ස්විට්සර්ලන්තයේ රසායනාගාරයකදී සොයා ගන්නා ලද එල්. එස්. ඩී. මෙක්සිකෝවේ ආගමිකයන්ගේ මෙස්කලීන්" වෛදික යුගයේ සිට පැවත එන සෝම ආදී ඖෂධීය ද්‍රව්‍යයන් මගින් උත්පාදනය කරනු ලබන සුවිශේෂී මානසික තත්ත්වයන් හා සැසඳිමේ දී නැගෙන ප්‍රශ්නය වන්නේ යෝගී ආනුභූතීන් හා ඒවාත් අතර ඇති වෙනස කුමක්ද යන්නය. ආගමික ආනුභූත්වය අගය කරන්නන් මෙහිදී පවසනුයේ කෘතිම ක්‍රම මගින් උත්පාදනය කරනු ලබන අනුභූතීන්ට වඩා ආගමික අනුභූතීය වෙනස් බවයි. යෝගාවචරයන්ගේ අනුභූතිය ස්වශක්තියෙන්ම උපදවා ගනු ලබන්නක් වීම ඊට හේතුව ලෙස ඔවුහු දක්වති.

ආගමික යෝගාවචරයෙන් කෘතිම ක්‍රම උපයෝගී කර නොගත්තද ඔවුන් අප ගමනය කරන දෛනික ක්‍රියා කලාපය, රසායනික කෘතිම ක්‍රමයන්ගෙන් ජනිත කරනු ලබන මානසික විපර්යාසයට සමාන තත්ත්වයක් උද්ගත කරවන්නක් බව ගූඪ අනුභූතීන් පිළිබඳ පර්යේෂණ කළවුන් විසින් අනාවරණය කොට ඇත. මෙකී යෝගීහු බොහෝ විට අඳුරු ගුහාවල වසන කටුක දිවි පැවැත්මක් ඇත්තෝය. ආශ්වාස ප්‍රාශ්වාස පාලනය, නිදි මැරීම, ඉන්ද්‍රිය උත්තේජනයන්ගෙන් හැකිතරම් ඈත් වීම, ආහාර පාන වාරණයන් හා වෙනත් එබඳු රූක්ෂ පිළිවෙත්වල ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ගේ ශාරීරික රසායනික විපර්යාසයන් ඇතිවීම වැළැක්විය නොහැකි බව යථෝක්ත පර්යේෂකයෝ පෙන්වා දෙති.





ගූඪ අනුභූතීන් පිළිබඳව මෙසේ පර්යේෂණ පැවැත්වූවන් අතර විලියම් ජේම්ස් , ඩබ්. ටී. ස්ටෙස්, විලියම් රිචඩ් හා වෝල්ටර් පාජකර් ආදීහු වැදගත් වෙති. එබඳු පර්යේෂණ මගින් රිචඩ් හා පාජරේ විසින් අනාවරණය කරන ලද පරිදි ගූඪ අනුභූතීන්හි මූලික ලක්ෂණ 09 ක් පෙන්වා දිය හැක.

1. **ඒකත්වය :** බහුත්වය පිළිබඳ හැඟීම් නැතිව ගොස් ඒකත්වය පිළිබඳ හැඟීමක් ඇතිවන්නට පටන් ගැනීමයි.

2. **වාස්තවිකත්වය හා සත්භාවී ස්වරූපය :**
   මේ හා සම්බන්ධ තවත් කරුණු දෙකකි.
   (1) පැවැත්ම හා ජීවිතය පිළිබඳ ඉතාමත්ම ගැඹුරු වූ ප්‍රතිභාවක් ලැබීම.
   (11) එම ඥාණය ඇතිවීමේ දී එය ආත්මීය එකක් නොව සත්‍ය වූ පරමාර්ථමය වූ වාස්තවික වූ ඥානයකැයි ඒත්තු යාම.

3. **කාලයෙන් හා අවකාශයෙන් ඔබ්බට යාම :**
   එම අනුභූතින් කාලයටම හා අවකාශයට අනුව සීමා වී නැති බව.
4. **අනුභූතීන්හි දක්නට ලැබෙන පූජනීයත්වය**
5. **ගැඹුරු මානසික සුබ සහගත බවක් දැනී යාම**
6. **විරුද්ධාභාසී ස්වරූපය :**
   එනම් අනුභූත්වය පැහැදිළිව වචනයට නැගිය නොහැකි වීමයි. වෙන වචන වලින් ප්‍රකාශ කිරීමට යාමේදී විසංවාදි බවක් ඇති වේ.
7. **අනිර්වචනීය ස්වරූපය**
8. **තාවකාලිකත්වය :**
   අනුභූතිය දිගු වෙලාවක් නොපවතී. සුළු මොහොතකට සීමා වෙයි.
9. **තමන්ගේ ආකල්පවල හා චර්යාවේ ඇතිවන වෙනස්කම් :**
   අනුභූතින්හි ප්‍රතිඵලයක් වශයෙන් පුද්ගල චර්යාවේ විවිධ වෙනස්කම් ඇති වේ. ඒවා ආගමික නැත්නම් සදාචාරමය විය හැක. අනුභූතිය ලැබීමෙන් ඉක්බිති පුද්ගලයා වඩා හොඳ අයෙකු වේ.

ආගමික බැතිමතුන් නොවන ඇතැමුන් යෝග භාවනා, රසායනික ඖෂධ ආදී කිසිවක උපකාරයකින් තොරව ගුඪ අනුභූතීන් ලැබීම මෙහිදී අප අවධානය යොමු විය යුතු තවත් කරුණකි. බටහිර සුප්‍රකට කවියෙකුව සිටි ටෙනිසන් හා චින්තකයෙකු වූ ආතර් කර්ස්ල ද මේ සඳහා නිදසුන් වෙති. මේ කරුණු අපට පෙන්වා දෙන්නේ විශ්වාසයෙන් සනාථ කිරීමේ සාධක වශයෙන් ආගමික අනුභූතින් දැක්විය හැකි බවයි. එනම් ගුඪ අනුභූතියක් මගින් වාස්තවික කරුණක් ඔප්පු කළ නොහැක යන්නයි.

බෞද්ධ දර්ශනයෙහි දැක්වෙන නිර්වාණය ද ගුඪ අනුභූතියක් යැයි ඇතැමුන් කරන ප්‍රකාශය පිළිබඳව විමසීම මෙහිදී ප්‍රයෝජනවත්ය. නිවන යන්නෙහි ලක්ෂණ කීපයකි. පරමපූර්ණ අවබෝධය එහි එක් ලක්ෂණයකි. පරමපූර්ණ විමුක්තිය පදනම් කරගත් පරමපූර්ණ සුවය තවෙකකි. අර්හත්වය හෙවත් පරමපූර්ණත්වයට පත් පුද්ගලයාගේ මෙලොව කෙරෙන ජීවිතය මේ ලක්ෂණයන්ගෙන් අර්ථවත් වන අතර එය සොපාදිසෙස නිවන නමින් හැඳින්වෙයි. මේ සොපාදිසෙස තත්ත්වය අනුක්‍රමික ප්‍රතිපදාවක් මගින් සාක්ෂාත් කළ යුත්තක් බව දක්වා තිබේ. මෙම ප්‍රතිපදාවේ විශේෂ ලක්ෂණයක් වන්නේ එහි ඒ ඒ අවස්ථාවේද ලබන්නා වූ විශේෂ අනුභූතීන් එකින් එක ප්‍රතික්ෂේප කිරීම වශයෙන් බැහැර කරමින් අනෙකට මාරු වෙමින් ඉදිරියට ගමන් කිරීමයි. එසේ හැර දමනු ලැබීමට හේතුව හැටියට දැක්වෙන්නේ ඒ සෑම අනුභූතියක්ම මානසික වශයෙන් අභිසංස්කරණය කරන ලද්දක් (අභිසංඛතං) සිතෙන් හට ගන්වන ලද්දක් (අභිසංචෙතයිතං) වීමය. සමසේ අනුපිළිවෙලින් බැහැර කිරීමට ලක්වන යෝගියා විසින් සාක්ෂාත් කරනු ලබන එම නිවන කරා යොමු වූ (නිබ්බාන නින්න නිබ්බාන පොණ) අනුභූති පරයිර එකින් එක ගෙන විමසා බැලීම මෙහිදී ප්‍රයෝජනවත් වේ.

1. **ප්‍රථම ධ්‍යානය :**
කාමයන් හා අකුසල ධර්මයන් කෙරෙන්ද වෙන්වූ යෝගාවචරයා ලබන්නා වූ විතර්ක - විචාර - විවේකයෙන් උපන් ප්‍රීති සැපය යන ලක්ෂණ සමුප්‍රයුක්ත පළමු විශේෂ අනුභූතිය මෙනමින් හැඳින්වේ. මේ අවස්ථාවේදී යෝගියාගේ කථාව හෙවත් භාෂණය නිරුද්ධය.





2. **ද්විතීය ධ්‍යානය :**
මෙම අනුභූතිය ලබන්නේ පූර්ව අවස්ථාවට අයත් විතර්කය හා විචාරය බැහැර කිරීමෙනි. අභ්‍යන්තර සම්ප්‍රසාදන සංඛ්‍යාත චිත්තේකාග්‍රතාවත් ඒ නිසා හටගත් ප්‍රීති සැපයත් මෙම දෙවන අනුභූතිය හා සම්ප්‍රයුක්ත ලක්ෂණ වෙති. මේ අවස්ථාවේ ලා නිරුද්ධ කරනු ලබන්නේ විතර්ක විචාර හෙවත් චින්තනයයි.

3. **තෘතීය ධ්‍යානය :**
යෝගියා මෙම තෙවන විශේෂ අනුභූතිය ලබන්නේ පූර්ව අවස්ථාවට අයත් ප්‍රීති සැපය අත් හැරීමෙනි. එසේ මෙම ධ්‍යාන සම්ප්‍රයුක්ත ලක්ෂණ වන්නේ සිහියෙන් හා නුවණින් යුක්ත මධ්‍යස්ථ භාවය හෙවත් උපේක්ෂාව හා කායික සුවයයි. නිරුද්ධ කරන ලද්දේ ප්‍රීතියයි.

4. **චතුර්ථ ධ්‍යානය :**
මෙම සිව්වන විශේෂ අනුභූතිය භෞතික ලෝක සඤ්ඤාව (රූපී) ඇතිව ලැබිය හැකි ඉහළම අය දැකුමයි. මෙහිදී උඩ කියන ලද අනුභූතියේදී විද උසස් වූ කායික සැපයද බැහැර කෙළෙ. උපේක්ෂාව හා පිරිසුදු සිහිය මෙහි සම්ප්‍රයුක්ත ලක්ෂණ වෙයි. මේ අවස්ථාවේදී ආශ්වාස - ප්‍රාශ්වාසයද නිරුද්ධ වන බව දක්වා ඇත.

5. **ආකාසානඤ්ඤායතනය :** භෞතික ලෝක සඤ්ඤාව (රූප සඤ්ඤා දුරු කිරීම මෙම අවස්ථාවේදී සිදු වේ.

6 **විඤ්ඤාණඤ්ඤායතනය :** මෙම අනුභූතිය අවකාශය පිළිබඳ සංඥාව (ආකාසඤ්ඤා) කෙරෙන් මිදුණකි.

7 **ආකිඤ්ඤායතනය :** මෙහිදී අරමුණු දැනගැනීම පිළිබඳ විඤ්ඤානා සඤ්ඤාව දුරු වෙයි.

8. **නෙවසඤ්ඤානාසඤ්ඤායතනය :** මෙම අනුභූතිය ඉතා සියුම් වූවකි. සඤ්ඤාව ඇත්තේද නැත්තේද නැති මෙය කිසිවක් නැත' (අකිඤ්චං) සංඥාව දුරු කිරීමෙන් ලබන්නකි.

(සං. නි. වේදනා සංයුක්ත ,රහෝගතවග්ග, සූත්‍රය, අමරසිහ හිමි සංස්.

මෙසේ අනුපිළිවෙලින් ලබන්නා වූ මෙම අනුභූතීන් විටෙක දේවවාදීන් ලබන්නේ යැයි කියන අනුභූතීන් හා සමානතත්වයක් උසුලන නමුදු ඒවා පිළිබඳ දේවවාදීන් කරන විග්‍රහයෙන් හා ආකල්පයෙන් විග්‍රහය හා ආකල්පය මුළුමණින් වෙනස් බව මෙහිදී අවධාරණයෙන් සැලකිය යුතුය. "ඒ අනුභූතීන් පරම වූත් වාස්තවික සත්‍ය ප්‍රකාශ කරන්නාවූත් ඒවාය යනුවෙන් දේවවාදීන් දරන මතය බුදුසමය අනුමත නොකරයි. බුදුසමය , ඒවා හුදු මානසික අවස්ථාවන් පමණක් බවත් , හැර දැමිය යුතු , කලකිරිය යුතු , උපාදාන වශයෙන් දැඩිව අල්ලා නොගත යුතු , මමායනය - කේලායතය නොකළ යුතු සංඛත තත්වයන් පමණක් බවත් කියයි. (ම.නි. 331, චූල සුඤ්ඤත සූත්‍රය)

මෙසේ මේ අනුභූතීන්ගේ වැදගත්කමක් දක්නට නොමැති නම් මෙසේ අනුක්‍රමයෙන් ප්‍රගුණ කළ යුතු බව දක්වා ඇත්තේ ඇයි? මීට පිළිතුරු වශයෙන් කරුණු 2 ක් ගෙනහැර දැක්විය හැකිය.

1. මෙම ධ්‍යානයන්ට සමවැදීමේ දී බලවත් චිත්තේකග්‍රතාවක් ඇති වී එමගින් පෞරුෂ සමෝධානයක් ඇතිවීම.

2. සියළු ආකාරයේ අනුභූති තලයන් ප්‍රගුණ කිරීමෙන් අධ්‍යාත්මික අවබෝධය පුළුල් වීම.
යනු ඒ දෙකරුණයි ,

බෞද්ධ අනුභූතීන්ට සමාන අනුභූතීන් මත්ද්‍රව්‍ය මගින් ඇතිකරගත නොහැකිද යනුවෙන් අයෙකුට මෙහිදී ප්‍රශ්න කළ හැකිය. බෞද්ධ ගූඪ අනුභූතීන්ගේ වැදගත්කම ඉස්මතු වී පෙනෙන්නේ මෙම අවස්ථාවේදීය. කෘතිම ලෙස ජනනය කරනු ලබන අනුභූතීන් පුද්ගලයාගේ පාලනයට යටත් නොවන අතර ඒවා සිය වසඟයෙහි පවත්නේ නොවේ. අනුභූතිය ලබන්නා ඊට සම්පූර්ණයෙන්ම යටත් වෙයි. එය ඔහුට අධ්‍යයන නොකළ හැකිය. යම් අනුභූතියක නියම ස්වරූපය අවබෝධ කර ගැනීමට නම් අප ඒවා ඇති කරගෙන අපම





එහි පාලකයන් විය යුතු වෙමු. බෞද්ධ අනුභූතීන්හි ඇත්තේ එම ලක්ෂණයයි. බෞද්ධ යෝගියා තමන් ලබන අනුභූතිය පිළිබඳ අවබෝධයෙන් යුතුව එය අධ්‍යයනය කොට එහි සංඛතත්වය නිස්සාරත්වය උලුප්පා දක්වන ඊට අයත් අනිත්‍ය - දුක්ඛ - අනාත්ම ලක්ෂණයන් පැහැදිලිව දකී. ඒ කෙරෙහි නොඇලීමට හා එය දුරු කිරීමටත් ඔහුව යොමු කරවන්නේ මේ ප්‍රත්‍යක්ෂ අවබෝධයයි,

බුදු සමයේ ඉගැන්වෙන නව වන සමාපත්තිය වන සඤ්ඤා වෙදයිත නිරෝධය අනෙක් සියළු අනුභූතීන්ගෙන් වෙනස් වන්නේ එය ප්‍රතිජානන අනුභූතියක් නොව නිශේධන අනුභූතියක් වීම නිසාය. ඊට හේතුව එහිදී කිසිවක් අනුභූතිමත් නොකිරීමයි. එසේද වුව එය ඇතැම් විචාරකයන් සිතන පරිදි නිවන නොවේ. සංඥාව හා වේදනාවද මුළුමනින් නිරුද්ධ කිරීමෙන් ප්‍රත්‍යක්ෂ කරනු ලබන සමාපත්තියක් හෙවත් අන් ලදහැකි සියළු අනුභූතීන්ට වෙනස් වූ 'අනුභූතියකි.' පිරිනිවන් මංචකයෙහි වැඩහුන් බුදුන් වහන්සේ පශ්චිම අවවාදය වදාරා පූර්වෝක්ත ප්‍රථම ධ්‍යානාදී අනුභූතීන්ට අනුපිළිවෙලින් සමවදිමින් අවසානයේදී නිරෝධ සමවතට සමවදිති. බුදුන් වහන්සේ පිරිනිවියේවනැයි මෙවිට අනඳ හිමියෝ සිතති. උන් වහන්සේ පිරිනිවන් පෑයේ නැති බවත් නිරෝධයට සමවැදුණා පමණක් බවත් මෙහිදී අනුරුද්ධ හිමියෝ පෙන්වා දෙති. (දි. නි. මහා පරිනිබ්බාන සූත්‍රය) නිවන හා නිරෝධ සමාත්තිය එකක් නොව දෙකක් බව මින් පැහැදිළි වෙයි. කෙසේ වුවද නිවනට එහි ඇති සමානත්වය නිසා නිවන් පත් උතුමාට පහසුවෙන් ඊට සමවැදිය හැකිවේ.

මෙසේ ප්‍රථම ධ්‍යානයේ සිට සඤ්ඤා වේදයිත නිරෝධය දක්වාම එම අනුභූතීන් ක්‍රමයෙන් ප්‍රගුණ කළ යුතු වන්නේ ඒ සියළු අනුභූතීන්ගෙන් ඔබ්බට යාම සඳහාය. (මෙසේ විස්තර වන්නේ නිවන් ලබනු සඳහා වන එක් මඟක් පමණක් බවත්, ඒ සඳහා ගමන් කළ හැකි වෙනත් ප්‍රතිපදා ද ඇති බවත් මෙහිදී මතක් කළ යුතුවේ.) එනම් නිර්වාණාධිගමය කරනු සඳහාය. නිවන ගූඪ අනුභූතියක්ද

ප්‍රශ්නය නැගී තිබේ. එය එසේ නොවන්නේ කරුණු දෙකක් නිසා ය. එනම් :

1. සඤ්ඤා වේදයිත නිරෝධ අවස්ථාවට පවත්වන විට සියළුම ආකාරයේ ගුඪ අනුභූතීන් අහෝසිකර දැමීම.
2. නිවන සඳහා සඤ්ඤා වෙදයිත නිරෝධයෙන් ද ඔබ්බට යා යුතු වීම යන ඒවා ය.

නිවන ගුඪ අනුභූතියක් නොවන බව එහි ස්වරූපය දැක්වීම සඳහා පෙළෙහි දෙනු ලබන පදයන්ගෙන් ද පැහැදිලි ය. අඤ්ඤා, අඤ්ඤා විසුද්ධි, විජ්ජා , තමොක්ඛන්ධං පදලිත, පඤ්ඤා, ඤාණං වැනි නිර්වානාවාචික පද වලින් 'නිවන පරම පූර්ණ අවබෝධයකි' යන අර්ථය ගෙන දේ. සබ්බසංයොජනක්ඛය, චේතොවසිප්පත්ත, අප්පමාණ ආදී පද එහි පරමපූර්ණ විමුක්ති ස්වභාවය හෙළිදරව් කරන අතර පරමපූර්ණ සැපයක් ලෙස ද නිවන විස්තර කළ හැකි බව විමුත්තිසුඛපටිසංවේදී, නිබ්බානං පරමං සුඛං ආදී ප්‍රකාශන පද අපට පෙන්වා දෙයි. එසේ ම නිවන යනු සදාචාරාත්මක ප්‍රාරප්‍රාප්තියකි. එම පරමපූර්ණ සදාචාරය හඟවන ප්‍රකාශන හැටියට රාගක්ඛය, දෙසක්ඛය, මොහක්ඛය, තණ්හක්ඛය, පහිණමාන ආදිය දැක්විය හැකි ය. මෙකී නිදසුන් මතින් පැහැදිලි වන්නේ නිවන ගුඪ අනුභූතියකැයි කෙසේවත් විස්තර නොකළ හැකි බවයි.

## ආශ්‍රිත ග්‍රන්ථ :


Underhill Eveyn, Mysticism, London, 1962.

Ctto, R., Mystjcism East and West, London, 1932

James, William, Variaties of Religious Experience Newyork , 1935

Joinnsson , Rusc, The Psychology of Nirvana, London, 1969

ධම්සිරි,ගුණපාල, බෞද්ධ සදාචාරයේ මූලධර්ම, කොළඹ,1988

Dhar,asiri, Gunapala, A Fueddhist Critique of the Christian Concepts of God, Colombo , 1974

Nanamoli Thera, Cula - Sunnatz - Sutta. Translated in 'A Treasury cf the Buddha's \\ crds : D successes from the Middle Cellection, Vol. 2. Bangkok : Undated.